# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 1987 අංක 32 දරන බෙදුම් නඩු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1987 ජූනි මස 25 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1987 ජූනි මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක

මිල : ශත 60 යි. | තැපැල් ගාස්තුව : ශත 75 යි.

## 1987 අංක 32 දරන බෙදුම් නඩු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1987 ජූනි මස 25 වන දින.]

එල්. ඩී.—ඕ. 40/86.

**ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 21 දරන බෙදුම් නඩු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—**

1. මේ පනත 1987 අංක 32 දරන බෙදුම් නඩු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

2. මෙහි මින්මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන, ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 21 දරන බෙදුම් නඩු පනතේ 16 වන වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අලුත් උපවගන්ති එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— **ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 21 දරන පනතේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම.**

"(3) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මිනින්දෝරුවරයකු වෙත අධිකාර පත්‍රයක් නිකුත් කරන ලෙස අධිකරණය විසින් අණ කරනු ලැබූ අවස්ථාවක, මැනීම කරන අවස්ථාවේදී නඩුව අදාළ වන ඉඩමට යම්කිසි හිමිකම් පෑමක් ඉදිරිපත් කර සිටින (නඩුවේ පාර්ශ්ව කරුවකු නොවූ) යම් තැනැත්තකුට හෝ යම් තැනැත්තකුගේ අනුයෝජිතයකුට භාර දීම සඳහා අවශ්‍යවන කරුණු අනුව ප්‍රමාණවත් යැයි අධිකරණය සලකනු ලබන, මේ පනතේ දෙවන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූල වූ දැන්වීමක පිටපත් යම් සංඛ්‍යාවක්, ඒවායේ පරිවර්තන ද සමඟ ඒ මිනින්දෝරුවරයාට නිකුත් කරන ලෙස අධිකරණය විසින් වැඩිදුරටත් අණ කළ යුතු ය.

(4) මේ වගන්තියේ (3) වන උපවගන්තියෙහි සඳහන් දැන්වීමේ පිටපත මැනීම කරන අවස්ථාවේදී යම් හිමිකම් පෑමක් ඉදිරිපත් කර සිටින (නඩුවේ පාර්ශ්වකරුවකු නොවූ) යම් තැනැත්තකුට හෝ ඔහුගේ අනුයෝජිතයාට හෝ, ඒ තැනැත්තාගේ නැතහොත් අනුයෝජිතයාගේ භාෂාව අධිකරණයේ භාෂාව නොවන්නේ නම් ඔහුගේ භාෂාවෙන් වන පරිවර්තනයක් ද සමඟ, මිනින්දෝරුවරයා විසින් පෞද්ගලිකව භාරදීමෙන් භාර කළ යුතු ය.

(5) මේ වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ දැන්වීමක් භාර දෙනු ලැබූ තැනැත්තාගෙන්, ඒ දැන්වීම ලැබුණු බවට ඒ තැනැත්තාගේ හෝ අනුයෝජිතයාගේ අත්සන හෝ මාපටැඟිලි සලකුණ සහ එය භාර දෙනු ලැබූ දිනය සහිත ලදුපතක්, මිනින්දෝරුවරයා විසින් ලබා ගත යුතු ය.

(6) මේ වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ දැන්වීමක් භාර දෙනු ලැබූ යම් තැනැත්තකු පසුව නඩුවේ විත්තිකරුවකු ලෙස එකතු කරනු ලැබූ අවස්ථාවක, මේ වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ ඒ තැනැත්තා වෙත හෝ ඔහුගේ අනුයෝජිතයා වෙත හෝ මිනින්දෝරුවරයා විසින් භාර දෙනු ලැබූ දැන්වීම මේ පනතේ විධිවිධාන යටතේ, මේ නඩුවෙහි ලා ඒ තැනැත්තා වෙත භාර දෙන ලද සිතාසියක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ තැනැත්තා වෙත තවදුරටත් සිතාසි නිකුත් කිරීම අවශ්‍ය නොවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ (iv) වන අනුඡේදයේ "යම් තැනැත්තකුගේ නම සහ ලිපිනය සහ ඔහුගේ හිමිකම් පෑමේ ස්වභාවය ;" යන වචන වෙනුවට "යම් තැනැත්තකුගේ නම සහ ලිපිනය, ඔහුගේ හිමිකම් පෑමේ ස්වභාවය සහ 16 වන වගන්තියේ (3) වන උපවගන්තියේ සඳහන් දැන්වීම භාර දුන් දිනය ;" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :—

(ඈ) 16 වන වගන්තියේ (4) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු වෙත භාර දෙනු ලැබූ දැන්වීම ලැබුණු බවට වූ ලදුපත සහ ඒ දැන්වීමේ ඉතිරි පිටපත් සහ පරිවර්තන ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තියේ "පැමිණිල්ලේ නම් සඳහන් කර ඇති හෝ ඒ බෙදුම් නඩුවේ පාර්ශ්වකරුවකු වශයෙන් එකතු කරනු ලැබීමට අපේක්ෂා කරන" යන වචන වෙනුවට "පැමිණිල්ලේ නම් සඳහන් කර ඇති හෝ ඒ බෙදුම් නඩුවේ විත්තිකරුවකු වශයෙන් එකතු කරන ලද හෝ පාර්ශ්වකරුවකු වශයෙන් එකතු කරනු ලැබීමට අපේක්ෂා කරන" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) 16 වන වගන්තිය යටතේ නියමිත "මුල් මැනීම සඳහා අධිකාර පත්‍රය" යන ශීර්ෂය යටතේ ඇති ආකෘති පත්‍රයේ "ඔබේ ශාස්තු වශයෙන්" .............. යන වචනවල සිට "19...... මස ... වන දින දිය" යන වචන හා ඉලක්කම් තෙක් ඇති සියලු වචන හා ඉලක්කම් වෙනුවට මෙහි පහත දැක්වෙන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් :—

"මැනීම කරන අවස්ථාවේ දී ඉඩම සම්බන්ධයෙන් යම්කිසි හිමිකම් පෑමක් ඉදිරිපත් කර සිටින (නඩුවේ පාර්ශ්වකරුවකු නොවූ) යම් තැනැත්තකුට හෝ ඒ තැනැත්තාගේ අනුයෝජිතයාට 16 වන වගන්තියේ (3) වන උපවගන්තියේ සඳහන් දැන්වීමේ පිටපත භාර දෙන ලෙස ඔබට මෙයින්/වැඩිදුරටත් නියම කරනු ලැබේ.

ඔබේ ගාස්තු වෙනුවෙන් රු.................ක මුදලක් අධිකරණයෙහි තැන්පත් කර ඇත.

මේ නඩුව 19............ මස ...... දින විවෘත අධිකරණයේ දී නැවත අඩ ගසනු ලැබේ.

19.............. මස ...... වන දින දීය.".

(2) 16 වන වගන්තිය යටතේ නියමිත "මුල් මැනීම සඳහා අධිකාර පත්‍රය" යන ශීර්ෂය යටතේ ඇති ආකෘති පත්‍රයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ආකෘති පත්‍රය ඇතුළත් කිරීමෙන් :—

"හිමිකම් පා සිටින තැනැත්තා වෙත හෝ අනුයෝජිතයා වෙත මිනින්දෝරුවරයා විසින් භාර දිය යුතු දැන්වීමේ ආකෘතිය.

(16(3) වන වගන්තිය)

................. දිසා අධිකරණයේ දීය.

නඩු අංකය : ..................

ඒ. බී. ...............................................................................

පැමිණිලිකරු

එදිරිව

සී. ඩී. ...............................................................................

විත්තිකරුවෝ

සහ තවත් අය.

...................... ....................................... වෙතටය.

(හිමිකම් පා සිටින තැනැත්තාගේ හෝ අනුයෝජිතයාගේ නම ඇතුළත් කරන්න)

.............................................................

යනුවෙන් හඳුන්වනු ලබන්නා වූ ද ...................... දිස්ත්‍රික්කයේ ....................ගමේ/ගම්වල පිහිටා ඇත්තා වූ ද ඉඩම/ඉඩම් බෙදා වෙන් කිරීම/විකිණීම සඳහා 1987 අංක 32 දරන පනතින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 21 දරන බෙදුම් නඩු පනත යටතේ ................. දිසා අධිකරණයෙහි අංක ...... දරන නඩුව පවරා ඇති බව ඔබට මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම ඉඩම/ඉඩම් පිළිබඳව යම් සම්බන්ධතාවයකට ඔබ හිමිකම් පා සිටින්නේ නම්, ඉහත කී නඩුවේ පාර්ශ්වකරුවකු වශයෙන් එකතු කරනු ලැබීම සඳහා 19 ............ මස ............ දින හෝ එදිනට පෙර මෝසමක් මගින් ඒ සඳහා ඉල්ලුම් කරන ලෙස ද,

ඔබගේ හිමිකම් පෑමේ ප්‍රකාශය ගොනු කරන ලෙස ද, 19 වන වගන්තියේ නියමයන් අනුව ක්‍රියා කරන ලෙස ද ඔබට මෙයින් නියම කරනු ලැබේ. මේ නඩුව 19 ............ මස ............ දින විවෘත අධිකරණයේ දී නැවත අඩ ගසනු ලැබේ.

අත්සන................,

අධිකාර පත්‍රලාභී.

19.........මස.........වන දින දීය ".

(3) 18 (1) (අ) වන වගන්තිය යටතේ නියමිත " මිනින්දෝරු වරයාගේ වාර්තාවේ ආකෘතිය " යන ශීර්ෂය යටතේ ඇති ආකෘතියේ (viii) වන අනුච්ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් අනුච්ඡේදය ආදේශ කිරීමෙන්—

" (viii) (නඩුවේ පාර්ශ්වකරුවන් නොවූ) හිමිකම් පෑ සිටින තැනැත්තෝ, ඔවුන්ගේ ලිපින, හිමිකම්පෑම්වල ස්වභාවය සහ ඔවුන් වෙත ඇන්වීම් භාර දෙනු ලැබූ දිනය.".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ලබාගත හැකිය.